සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක : 03 / 2025

මගේ අංකය: PPSC/ES/11/F1/06/DO-2
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
පළාත් සභා සංකීර්ණය,
නවනගරය.රත්නපුර.
2025.01. 25

සබරගමුව පළාත් සභාවේ,

01.ප්‍රධාන ලේකම්,
02.ආණ්ඩුකාර ලේකම්,
03.සභා ලේකම්/සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
04.සියළුම පළාත් කොමසාරිස්වරුන් / පළාත් අධ්‍යක්ෂවරුන්,
05.දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
06.පළාත් පාලන ආයතනවල ලේකම්වරුන් වෙත,

## සබරගමුව පළාත් රාජ්‍ය සේවා සංවර්ධන නිලධාරී II වන ශ්‍රේණියට අදාල දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම්පත් කැඳවීම - 2025 මාර්තු

සබරගමුව පළාත් රාජ්‍ය සේවා සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වන ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව, දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025 මාර්තු මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. 1999 වර්ෂයේදී රජයේ ප්‍රමුඛතා කාර්යයන් සඳහා බඳවාගත් උපාධිධාරීන්, 2005/2006 වර්ෂවලදී බඳවා ගත් වැඩසටහන් සහකාර උපාධිධාරීන්, 2008 වර්ෂයේ තරුණ අරුණ වැඩ සටහන යටතේ බඳවාගත් වැඩසටහන් සහකාර උපාධිධාරීන් හා 2013 සහ 2014 වර්ෂ වලදී බඳවාගත් සංවර්ධන නිලධාරීන් අතරින් මේ වන විට II වන ශ්‍රේණියට උසස්වීම් ලබා තිබෙන නිලධාරීන්ගෙන් දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා මින් අයදුම්පත් කැඳවනු ලැබේ. සංවර්ධන නිලධාරි ව්‍යවස්ථාවට අනුව මීට පෙර පැවැති දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග වලට පෙනී සිට එක් විෂයක් අසමත් නිලධාරීන්ට මෙම විභාගයේ එම අසමත් විෂය සඳහා පමණක් පෙනී සිටිය හැකිය. එහෙත් දැනට සංවර්ධන නිලධාරි තනතුරට අන්තර්ග්‍රහණය වී සිටින මෙතෙක් දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ පැරණි නිර්දේශය යටතේ විභාගයට පෙනී සිට විෂයයන් දෙකම හෝ එක් විෂයයක් පමණක් හෝ අසමත් සියළු නිලධාරීන් මෙම විභාගය සඳහා සම්පූර්ණයෙන්ම ඉදිරිපත්වීම කළ යුතු වේ.

03. මෙම චක්‍රලේඛ ලිපිය ඔබ අමාත්‍යාංශය යටතේ සේවය කරන අදාල නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කිරීමට ක්‍රියාකරන ලෙස මින් ඉල්ලමි. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට මෙම චක්‍රලේඛ ලිපියේ පිටපත් මේ සමඟ යවන අතර, සබරගමුව පළාතේ පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් වෙතද මේ සමඟ මෙහි පිටපත් යවා ඇත. එබැවින් අනෙකුත් ආයතන වලට මෙම චක්‍රලේඛ ලිපිය වහාම බෙදා හැරීම සඳහා ක්‍රියා කරන්න.

04. මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අයදුම්පත් කැඳවනුයේ සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන , වර්තමානයේ සංවර්ධන නිලධාරි තනතුරේ II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වී හෝ උසස්වීම් ලබා සිටින, මෙතෙක් දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී නොසිටින නිලධාරීන්ගෙනි. මධ්‍යම රාජ්‍ය සේවයේ අදාල තනතුරු දරණ හෝ ජාතික පාසල්වල සේවය කරන නිලධාරීන්ගේ අයදුම්පත් මේ සඳහා භාරගනු නොලැබේ. තවද දැනට සංවර්ධන නිලධාරි III වන ශ්‍රේණියේ සිටින කිසිදු නිලධාරියෙකු මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් නොකල යුතුය.

05. සබරගමුව පළාත් රාජ්‍ය සේවා සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ 16.1 වන පරිච්ඡේදයේ සඳහන් අන්තර්කාලීන විධිවිධාන පරිදි අන්තර්ග්‍රහණයට ප්‍රථම උපාධිධාරි නිලධාරීන් බඳවා ගන්නා ලද බඳවා ගැනීම් පරිපාටි වලට අනුව පවත්වන ලද දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව ඇති සියළු නිලධාරීන් සංවර්ධන නිලධාරි ව්‍යවස්ථාව යටතේ පවත්වනු ලබන මෙම විභාගයට පෙනී සිටීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වේ. නමුත් දැනට සංවර්ධන නිලධාරි II වන ශ්‍රේණියට උසස්වීම් ලබා තිබෙන එහෙත් දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී නොසිටි යම් නිලධාරීන් වේ නම් ඔවුන්ද මෙම විභාගයට පෙනී සිටිය යුතු අතර, පැරණි බඳවා ගැනීම් පරිපාටි යටතේ සැලසුම් හා මූල්‍ය සහකාර තනතුරේ සේවය කර මේ වන විට සංවර්ධන නිලධාරි II වන ශ්‍රේණියට උසස් වීම් ලබා සිටින නිලධාරීන්වද මෙම විභාගයට පෙනී සිට II ශ්‍රේණියට අදාල තම සේවා අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගත හැකිය.

06. සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ ඇමුණුම 03 හි සඳහන් පරිදි නිලධාරීන් විසින් අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් ප්‍රශ්න පත්‍ර දෙකකට (02) පිළිතුරු සැපයිය යුතුවේ. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුනු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට (02) පිළිතුරු සැපයිය යුතුවේ. තමන් ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. නිලධරයන්ට තම කැමැත්ත පරිදි එක් එක් විෂය සඳහා වෙන වෙනම වාරවලදී විභාගයට පෙනී සිටීමට හැකිවේ. එතෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතලිහක් (40 % ) ලබා ගත යුතුවේ. විෂය නිර්දේශය පහත පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| 2. මුදල් රෙගුලාසි සහ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | පැය 02 | 100 | 40% |

| පළමු ප්‍රශ්න පත්‍රය | | විෂය නිර්දේශය |
|---|---|---|
| ආයතන සංග්‍රහය | - | ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VI, VII, VIII, XII, XIII, XIV, XVII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII |

| දෙවන ප්‍රශ්න පත්‍රය | | විෂය නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි සහ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | - | පරිච්ඡේද I, II, III, IV, V හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය |

07. විභාග ගාස්තු - පළමු වරට මෙම විභාගයට පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුවෙන් නිදහස් කෙරේ. විෂයයන් දෙක සඳහාම නම් විභාග ගාස්තුව ලෙස රු.600/- ක් ද එක් විෂයයක් සඳහා නම් රු.250/-ක් ද ගෙවිය යුතුය. එම විභාග ගාස්තුව මෙම පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) කලාප අධ්‍යාපන කාර්යාලයකට හෝ සබරගමුව පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. එසේ ගෙවන විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ 20.03.02.99 ආදායම් ශීර්ෂයට බැරවන සේ ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ පසුපිටෙහි නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ප්‍රාදේශීය ලේකම්වරු එම විභාග ගාස්තු අය කිරීමේදී එම මුදල් මෙම පළාත් සභාවේ ඉහතින් සඳහන් ආදායම් ශීර්ෂයට බැර කිරීම සඳහා ක්‍රියා කළ යුතු බවද මෙහිලා විශේෂයෙන් ම සඳහන් කරමි.)

08. විභාගයට අයදුම්කිරීම - අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය.එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2025.02.17 දින හෝ ඊට පෙර ලැබෙන සේ **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත, පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර.** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත්** භාර දිය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. විභාගයට පෙනී සිටීම සඳහා පිළිගන්නා අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය, විභාගය පැවැත්වීමට දින 14 කට පෙර අයදුම්පතේ සඳහන් ලිපිනයට නිකුත් කරනු ලැබේ.

10. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

11. තවද විභාග වංචා සිදු කරන නිලධාරීන්ගේ විභාග ප්‍රතිඵල අත්හිටුවීමට කටයුතු කරන බව කණගාටුවෙන් වුවද දන්වා සිටින අතර, මේ සම්බන්ධයෙන් විභාගයට ඉදිරිපත් වන නිලධාරීන් දැනුවත් කරන මෙන්ද කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.ඩී.සී.සමරසේකර,
ලේකම්,
පළාත්රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත

එස්.එම්.ඩී.සී. සමරසේකර
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

පිටපත් -

01. ප්‍රාදේශීය ලේකම්වරු / සබරගමුව පළාත
- ඉහත තනතුරු දරණ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් ඔබ ආයතනය තුළ සිටීනම්, ඔවුන්ගේ දැනගැනීමට මෙය යොමු කරන්න. එසේම විභාගය සඳහා විභාග ගාස්තු ගෙවීමට ඉදිරිපත් වන අයගේ විභාග ගාස්තු ඉහත සඳහන් පරිදි පළාත් සභාවේ ආදායම් ශීර්ෂයට බැර කර ලදුපත් නිකුත් කිරීම සඳහා ක්‍රියා කරන මෙන්ද කාරුණිකව ඉල්ලමි.

02. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු සබරගමුව පළාත -
- මෙම චක්‍රලේඛ ලිපිය ඔබ කාර්යාලයේ හා පළාත් සභාවේ පාසල් වල ඉහත තනතුරු දරන නිලධාරීන්ගේ අවධානය සඳහා කඩිනමින් යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

සැලකිය යුතුයි -

**2013 හා 2014 වර්ෂ වලදී ස්ථිර පත්වීම් ලද සංවර්ධන නිලධාරීන් අතරින් 2025.02.17 දින වන විට II වන ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් පමණක් මෙම විභාගයට අයදුම් පත් එවිය යුතු වන අතර, ඉදිරියේදී මෙම කොමිෂන් සභාව විසින් වර්ෂයකට දෙවරක් වන සේ පවත්වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග වාර 06 ක් සඳහා පෙනී සිටීමට අවස්ථාව ලබා දීම තුලින් අදාල වර්ෂ 03 තුලදී මෙම විභාගය සම්පූර්ණ කර ගැනීමට අවස්ථාව හිමි වනු ඇත.**

ආදර්ශ අයදුම්පත්‍රය

**සබරගමුව පළාත් රාජ්‍ය සේවා සංවර්ධන නිලධාරි II වන ශ්‍රේණියට අදාල දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම් කිරීම - 2025 මාර්තු**

01. (අ) අයදුම්කරුගේ සම්පූර්ණ නම :-

(ආ) මුලකුරු සමඟ නම :-

02. ජාතික හැඳුනුම්පත් අංකය :-

03. ලබා ඇති ස්ථිර පත්වීම් ලිපියේ සඳහන් තනතුරු නාමය :-

04. එම ස්ථිර පත්වීම ක්‍රියාත්මක වූ දිනය :-

05. සංවර්ධන නිලධාරි II වන ශ්‍රේණියට උසස්වීම ක්‍රියාත්මක වන දිනය :-

06. සංවර්ධන නිලධාරි II වන ශ්‍රේණියට උසස්වීම් ලද ලිපියේ අංකය :- PPSC/ES/11/FI/.........................

07. සංවර්ධන නිලධාරි II වන ශ්‍රේණියට උසස්වීම් ලද ලිපියේ දිනය :- .......................................................

08. සංවර්ධන නිලධාරි තනතුරට අන්තර්ග්‍රහණය කරන ලද දිනය : - ( 2013 හා 2014 වර්ෂ වල ස්ථිර පත්වීම් සඳහා අදාල නොවේ.)

09. සංවර්ධන නිලධාරි තනතුරට අන්තර්ග්‍රහණය කරන ලද ශ්‍රේණිය : - ( 2013 හා 2014 වර්ෂ වල ස්ථිර පත්වීම් සඳහා අදාල නොවේ)

10. දැනට සේවය කරන කාර්යාලයේ / ආයතනයේ ලිපිනය හා දුරකතන අංකය :-

11. විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :-

12. දුරකථන අංකය : -
- පෞද්ගලික -
- කාර්යාලයීය -

13. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- රත්නපුර [ ] කෑගල්ල [ ]

14. මීට පෙර පැවැත්වූ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට ඔබ පෙනී සිටියේද? : - ඔව් / නැත
- එසේනම් විභාගයට පෙනී සිටි වර්ෂය : -

15. ඔබ විභාගයට පෙනී සිටින්නේ විෂයයන් දෙකම සඳහාද ? ඔව් / නැත
- පෙනී සිටින්නේ එක් විෂයක් සඳහා නම් අදාල විෂය සඳහන් කරන්න : -

16. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- සිංහල [ ] දෙමළ [ ]

17. මෙම විභාගය සඳහා අයදුම්පත් කැඳවා ඇති අංක 03 / 2025 දරණ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපියේ සඳහන් පරිදි විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :-

I. ගෙවූ විභාග ගාස්තුව රු. : -
II. එම මුදල ගෙවනු ලැබූ කාර්යාලයේ නම :-

III. ඒ සඳහා නිකුත් කල කුවිතාන්සියේ අංකය හා දිනය :-
(විභාග ගාස්තු ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙම අයදුම්පත්‍රයේ පසුපිටෙහි අලවන්න)

ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි.

දිනය - ............................ අයදුම්කරුගේ අත්සන : ..............................

**දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය**

ඉහත අයදුම්කරු මෙම කාර්යාලයේ / ආයතනයේ සේවය කරන සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි II වන ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති නිලධාරියෙකු / නිලධාරිනියක බවත්, ඉහත සියළු කරුණු නිවැරදි බවත්, ඔහුගේ / ඇයගේ අත්සන මා ඉදිරිපිටදී මෙම අයදුම්පත්‍රයේ සඳහන් කරන ලද බවත් සහතික කරමි.

දිනය :- ..............................

...............................................

දෙපාර්තමේන්තු /ආයතන
ප්‍රධානියාගේ අත්සන හා නිලනාමය
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)